අධ්‍යක්ෂ ජාතික ...
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08

NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,231/39 – 2002 අප්‍රේල් 12 වැනි සිකුරාදා – 2002.04.12

(ආණ්ඩුවේ බලයසිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

සබරගමුව පළාත් සභාව

2002 අංක 02 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

| | | |
|---|---|---|
| සහතිකය සටහන් කළේ | - | 2002.02.28 |
| අනුමැතිය ලැබුණේ | - | 2002.03.14 |

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඊ. එල්. චන්ද්‍රසේන,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාව

1. (1). 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය 1991 අංක 05 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සහ 1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති සංශෝධන කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි. දිර්ඝ නාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

(2) මෙම ප්‍රඥප්තිය 2002 අංක 02 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලඝු නාමය

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 1 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති අවලංගු කර පහත සඳහන් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. සබරගමුව පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ (1) වන වගන්තිය සංශෝධනය කිරීම.

"මෙම ප්‍රඥප්තිය 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය."

ජාතික පුස්තකාල ... ලය
දිනය: 16-07-08



සබරගමුව පළාත් 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති 2 වන වගන්තිය ලෙස ඇතුලත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සබරගමුව පළාත තුල පළාත් ආදායම් දෙපාර්තමේන්තුව යන නමින් හැඳින්වෙන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ.

80583
06 MAY 2002
NATIONAL LIBRARY AND DOCUMENTATION CENTRE

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා පිහිටුවනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්, පළාත් තක්සේරුකරුවන් සමඟ වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය.

(3). දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඒ ඒ වර්ෂයේ සබරගමුව පළාත් සභාවේ මුදල් ප්‍රකාශය මඟින් ලබාදෙන ප්‍රතිපාදන වලින් දරනු ලැබේ.

සබරගමුව පළාත් 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) උප වගන්තියේ "පළාත්" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "පළාත" යන වචනය ආදේශ කිරීමෙන් සහ "පනතේ" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "ප්‍රඥප්තියේ" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "වලංගු භාවය" යන වචනය ඉවත්කර, ඒ වෙනුවට "වලංගු භාවයට" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය "මෙය" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "වෙනස්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ යෝජනා වේ" යන වචන වලට ඉක්බිතිවම "සඳහන්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "නියමයන්" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "නියමයන්හි" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "කොමසාරිස්වරයා" යන වචනය ආදේශ කිරීමෙන් සහ "අනුමතව" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "අනුමැතිය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යොදා ඊට ඉක්බිතිවම පහත සඳහන් උපවගන්තිය (2) වන උපවගන්තිය වශයෙන් එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(2) යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඉහත (1) උපවගන්තියේ ප්‍රකාර ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබීමෙන් පසු එම කාර්තුවේ සම්පූර්ණ බද්ද රු. 200 කට අඩු නම් ගෙවීම පැහැර හැරීම සිදු වී ඇති යම් විශේෂ කාරනා හේතු කොටගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩුකිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩුකිරීම කළ හැකිය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (අ) සහ (ආ) උපවගන්තිවල සඳහන් "පැහැර ඇති" යන වචන ඉවත්කර ඒ වෙනුවට "පැහැර හැර ඇති" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "පනත" යන වචන ඉවත්කර ඒ වෙනුවට "ප්‍රඥප්තිය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අනුකූල වේ හෝ " යන වචන ඉවත්කර ඒ වෙනුවට "අනුකූල වේ නම් හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

එම වගන්තියේ (2) වන උපවගන්තියේ "ආදායම්" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "පිරිවැටුම්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



14. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "භාජන" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "භාවිතා" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.*

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ "කරන්නා හෝ" යන "කැප් කිරීම" යන වචන ඉවත්කර ඒ වෙනුවට පිළිවෙලින් "කරන්නාවූ හෝ" යන "කැප් කිරීමට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.*

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ "බාධා කරන්නා වූ", "ප්‍රමාද කරවූ" සහ "බන්ධනාගාරයක යන" වචන ඉවත්කර ඒ වෙනුවට පිළිවෙලින් "බාධා කරන්නා වූ හෝ", "ප්‍රමාද කරන්නා වූ" සහ "බන්ධනාගාරගත කිරීම" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.*

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (අ) උපවගන්තියේ "විකිණීමට" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "පැවරීමකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.*

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (4) උපවගන්තියේ "75" අංකය ඉවත්කිරීමෙන් සහ "වරමයක්" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "නියමයක්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.*

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) උපවගන්තියේ "විකිණීමකට" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "පැවරීමකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.*

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (3) උපවගන්තියට ඉක්බිතිව පහත සඳහන් උපවගන්ති (4) වන උප වගන්තිය වශයෙන් එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(4) ශ්‍රී ලංකාවේ [illegible] නීතියක් මගින් පිහිටුවන ලද යම් අධිකරණයක පවරනු ලබන නඩු කටයුතු වලදී ඉදිරිපත් කරනු ලබන හෝ යොදාගනු කරනු ලබන සෑම ලේඛනයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව ගෙවූ බව දක්වෙන සේ අලවන මුද්දර හෝ ලාංඡන මුද්දර භාවිතා කිරීම නැතහොත් ඉහත සඳහන් පරිදි බැංකුවක් වෙත ගෙවීම ප්‍රායෝගික වශයෙන් අපහසු වන අවස්ථාවක දී ඒ ලේඛනය සඳහා අය කළයුතු මුද්දර ගාස්තුවට සමාන මුදලක් අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලැබූ විට, එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ ගෙවීම කළ දිනය ඒ ලේඛනය මත රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කරනු ලැබිය හැකිය. එසේ සටහන් කරනු ලැබූ ලේඛනයක් යථා පරිදි මුද්දර ගැසූ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය."

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව පහත සඳහන් උප වගන්තිය (3) වන උප වගන්තිය වශයෙන් එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 46(3) වන නව වගන්තිය ඇතුළත් කිරීම.*

"(3) යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව ඉහත සඳහන් පරිදි සමර්ථයකට ගෙවා තිබියේ වුව ද, ඒ නොතකා, ඒ සාධන පත්‍රය හෝ ලේඛනය සම්බන්ධයෙන් ගෙවිය යුතු නිසි මුද්දර ගාස්තුව කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතුය."

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "සාධන ඉදිරිපත් කරනු නොලැබුවේ නම් හෝ ඉදිරිපත් කරන ලද සාධන" යන වචන ඉවත් කර ඒ වෙනුවට "සාධන පත්‍ර ඉදිරිපත් කරනු නොලැබුවේ නම් හෝ ඉදිරිපත් කරන ලද සාධන පත්‍ර" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.*

23. 1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙන් සංශෝධනය කර ඇති ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (අ) උපවගන්තියේ "පැවරුම්කරු" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "පැවරුම්ලාභියා හෝ පැවරුම්ලාභීන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.*

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "62" යන අංකය ඉවත් කර ඒ වෙනුවට "60" යන අංකය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.*

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යවනු තැනැත්තා" යන වචන ඉවත් කර ඒ වෙනුවට "යවනු ලබන තැනැත්තා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.*

26. 1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 14 වන වගන්තියෙන් සංශෝධනය කර ඇති ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "මේ ප්‍රඥප්තිය යටතේ බදු යටත් විය යුතුය" යන වචන වෙනුවට "මේ ප්‍රඥප්තිය යටතේ බදු යටත් විය යුතු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.*

සත්‍ය පිටපතක බව සහතික කරමි.

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (ආ) උපවගන්තියේ "රුපියල් තුන්දහසකට" යන වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් පන් දහසකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ 8 වන උප වගන්තියේ 2 වන උප වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (8) වන උප වගන්තියේ (2) වන උප වගන්තියේ "නියමකට" යන වචනය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ 8 වන උප වගන්තියේ 3 වන උප වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (8) වන උප වගන්තියේ (3) වන උප වගන්තියේ "(2) වන උප වගන්තිය" යන වචන ඉවත් කර ඒ වෙනුවට "(1) වන උප වගන්තිය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "පොරොත්තුවෙන්" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "බලාපොරොත්තුවෙන්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ xxvii වන පරිච්ඡේදයේ සිංහල යෙදුම සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂාවෙන් මුද්‍රිතව ඇති "xxxvii" යන යෙදුම ඉවත් කර ඒ වෙනුවට "xxvii" යන යෙදුම ආදේශ කිරීමෙන් එම යෙදුම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (5) වන උප වගන්තියේ "(3) වන උප වගන්තිය" යන යෙදුම ඉවත් කර ඒ වෙනුවට "(4) වන උප වගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන් එම යෙදුම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (ii) වන උප වගන්තියේ "පැහැර ඇති" යන වචන ඉවත් කර ඒ වෙනුවට "පැහැර හැර ඇති" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(2) පැහැර හැර ඇති තැනැත්තා විසින් 13 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ 14 වන වගන්තිය යටතේ හෝ 57 (1) (ආ) වගන්තිය යටතේ වූ තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට හෝ දැන්වීමකට හෝ විරුද්ධව නිසි කාල සීමාව ඇතුලත අභියාචනයක් කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුලත දී එසේ නියම කරනු ලැබූ බද්ද හෝ ගාස්තුව පිළිබඳව යම් විරෝධතාවයක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව තම තීරණය දිය යුතුය. එවිට ඒ තීරණය අවසානාත්මක වන්නේය."

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(3) මේ වගන්තියේ කුමක් සඳහන්ව ඇති ද 13 වන වගන්තියේ (1) වන උප වගන්තිය හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ 14 වන වගන්තිය යටතේ හෝ 57(1) (අ) වගන්තිය යටතේ වූ තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට හෝ දැන්වීමකට හෝ විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, ඒ තක්සේරුවේ හෝ අතිරේක තක්සේරුවේ හෝ දැන්වීමේ සඳහන් යම් බද්දක් හෝ ගාස්තුවක් ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් අනුව අත්හිටුවා ඇත්තා වූ ද, ඒ අභියාචනය විභාග කරනු ලබන අතරතුර ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව හෝ දැන්වීම සම්බන්ධයෙන් බදු හෝ ගාස්තු වශයෙන් යම් මුදලක් අය විය යුතු බවට හෝ අය වීමට ඉඩ ඇති බවට අභියාචක එකඟ වන්නා වූ ද අවස්ථාවක කොමසාරිස්වරයා විසින් අභියාචකට ලියවිල්ලකින් සාදනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් දිනයක් හෝ එදිනට පෙර දිනයක ඒ මුදල ගෙවන ලෙස අභියාචකට නියම කරනු ලැබිය හැකිය. ඒ දිනයට පෙර නොගෙවන ලද යම් මුදලක් පැහැර හරින ලද මුදලක් ලෙස සැලකිය යුතුය."

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උප වගන්තියේ "යම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක ඒ බද්ද" යන වචන ඉවත් කර ඒ වෙනුවට "යම් බද්දක් හෝ ගාස්තුවක් අඩු කරනු ලබන අවස්ථාවක ඒ බද්ද හෝ ගාස්තුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තියේ (7) වන උප වගන්තියේ "ගාස්තු ප්‍රමාණය" යන වචන ඉවත් කර ඒ වෙනුවට "බදු ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



*ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.*

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (ආ) උපවගන්තියේ "රුපියල් තුන්දහසකට" යන වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් පන් දහසකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ 8 වන උප වගන්තියේ 2 වන උප වගන්තිය සංශෝධනය කිරීම.*

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (8) වන උප වගන්තියේ (2) වන උප වගන්තියේ "නියමකට" යන වචනය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ 8 වන උප වගන්තියේ 3 වන උප වගන්තිය සංශෝධනය කිරීම.*

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (8) වන උප වගන්තියේ (3) වන උප වගන්තියේ "(2) වන උප වගන්තිය" යන වචන ඉවත් කර ඒ වෙනුවට "(1) වන උප වගන්තිය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.*

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "පොරොත්තුවෙන්" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "බලාපොරොත්තුවෙන්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ xxvii වන පරිච්ඡේදයේ සිංහල යෙදුම සංශෝධනය කිරීම.*

31. ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂාවෙන් මුද්‍රිතව ඇති "xxxvii" යන යෙදුම ඉවත් කර ඒ වෙනුවට "xxvii" යන යෙදුම ආදේශ කිරීමෙන් එම යෙදුම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.*

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (5) වන උප වගන්තියේ "(3) වන උප වගන්තිය" යන යෙදුම ඉවත් කර ඒ වෙනුවට "(4) වන උප වගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන් එම යෙදුම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.*

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (ii) වන උප වගන්තියේ "පැහැර ඇති" යන වචන ඉවත් කර ඒ වෙනුවට "පැහැර හැර ඇති" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.*

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(2) පැහැර හැර ඇති තැනැත්තා විසින් 13 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ 14 වන වගන්තිය යටතේ හෝ 57 (1) (ආ) වගන්තිය යටතේ වූ තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට හෝ දැන්වීමකට හෝ විරුද්ධව නියි කාල සීමාව ඇතුලත අභියාචනයක් කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුලත දී එසේ නියම කරනු ලැබූ බද්ද හෝ ගාස්තුව පිළිබඳව යම් විරෝධතාවයක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව තම තීරණය දිය යුතුය. එවිට ඒ තීරණය අවසානාත්මක වන්නේය."

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(3) මේ වගන්තියේ කුමක් සඳහන්ව ඇති ද 13 වන වගන්තියේ (1) වන උප වගන්තිය හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ 14 වන වගන්තිය යටතේ හෝ 57(1) (අ) වගන්තිය යටතේ වූ තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට හෝ දැන්වීමකට හෝ විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, ඒ තක්සේරුවේ හෝ අතිරේක තක්සේරුවේ හෝ දැන්වීමේ සඳහන් යම් බද්දක් හෝ ගාස්තුවක් ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් අනුව අත්හිටුවා ඇත්තා වූ ද, ඒ අභියාචනය විභාග කරනු ලබන අතරතුර ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව හෝ දැන්වීම සම්බන්ධයෙන් බදු හෝ ගාස්තු වශයෙන් යම් මුදලක් අය විය යුතු බවට හෝ අය වීමට ඉඩ ඇති බවට අභියාචක එකඟ වන්නා වූ ද අවස්ථාවක කොමසාරිස්වරයා විසින් අභියාචකට ලියවිල්ලකින් සාදනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් දිනයක් හෝ එදිනට පෙර දිනයක ඒ මුදල ගෙවන ලෙස අභියාචකට නියම කරනු ලැබිය හැකිය. ඒ දිනයට පෙර නොගෙවන ලද යම් මුදලක් පැහැර හරින ලද මුදලක් ලෙස සැලකිය යුතුය."

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උප වගන්තියේ "යම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක ඒ බද්ද" යන වචන ඉවත් කර ඒ වෙනුවට "යම් බද්දක් හෝ ගාස්තුවක් අඩු කරනු ලබන අවස්ථාවක ඒ බද්ද හෝ ගාස්තුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.*

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තියේ (7) වන උප වගන්තියේ "ගාස්තු ප්‍රමාණය" යන වචන ඉවත් කර ඒ වෙනුවට "බදු ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සභා පට්ටෙ : . 3.
අධ්‍යක්ෂ ජන
ජාතික පුස්තකාල හා ප්‍ර... මණ්ඩලය
දිනය: 16-07-08



සෑම තැනැත්තෙකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකාඩ වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගතකරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

48. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ "නියම" යන වචනය ඉවත්කර ඒ වෙනුවට "නිශ්චය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම

49. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ 104 (අ) (1) උප වගන්තියේ "පළාත් දිරිගැන්වීමේ" යන වචන ඉවත්කර ඒ වෙනුවට "පළාත් ආදායම් දිරිගැන්වීමේ " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම

50. ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ "78" යන යෙදුම ඉවත් කර ඒ වෙනුවට "73" යන යෙදුම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම

51. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) "මුද්‍රාංකනය" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "මුද්දර හා ගාස්තුවක් "යන වචන ඉවත් කර ඒ වෙනුවට "මුද්දර ගාස්තුවක් " යන වචන ආදේශ කිරීමෙන්

(ආ) "ලාංඡන මුද්දරය" යන්නෙහි අර්ථ නිරූපණයෙහි " දහයක් " යන වචනය ඉවත් කර ඒ වෙනුවට "දහසක්" යන වචනය ආදේශ කිරීමෙන් ;

1992 අංක 3 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

(ඇ) 1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 26 (ඇ) (ii) වගන්තියෙන් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියෙහි "බලයලත් නියෝජිතයා " යන්නෙහි අර්ථ නිරූපණයෙහි "දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා යන වචන ඉවත් කර ඒ වෙනුවට "1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) 1992 අංක 03 දරන මුදල් ( සංශෝධන) ප්‍රඥප්තියේ 26(ක) (අ) වගන්තියෙන් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියෙහි "වටිනාකම" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "වෙනස් වේ" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අඩු වේ " යන වචන ආදේශ කිරීමෙන්

(ඉ) ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියට 1992 අංක 03 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (අ), (ආ), (ඇ) (i) යන උපවගන්ති වලින් කරන ලද සංශෝධනය අවලංගු කිරීමෙන්

1992 අංක 3 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

52. 1992 අංක 03 දරන මුදල (සංශෝධන) ප්‍රඥප්තියේ 25 වන වගන්තිය අවලංගු කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

53. ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් වගන්තිය 108 වන වගන්තිය වශයෙන් එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ.

"108 මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය."

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බවය.

54 මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

2002.02.28 දින පැවති පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සභා සම්මත වූ බවට සහතික කරමි.

අතුල කරුණාරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

2002 මාර්තු මස 06 වන දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

වර්ෂ 2002 ක් වූ මාර්තු 14 වෙනි දින 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඎ) වගන්තිය යටතේ අනුමැතිය දෙමි.

සී. එන්. සාලිය වබ්ලිව්. මැතිව්,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

04-474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.